අනාවරණ

TRANSPARENCY INTERNATIONAL
the global coalition against corruption



# දරිද්‍රතාවය සහ දූෂණය

වසර 2007 දුගී බව හා දූෂණයට එරෙහි සටනේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළ වසරක් විය. අන්ත දරිද්‍රතාවය වසර 2015 වනවිට අවසන් කිරීම සඳහා වූ අතිශය බලාපොරොත්තු සහගත ගෝලීය ප්‍රතිඥාව සහශ්‍රක සංවර්ධන ඉලක්කයන් සපුරාලීමේ ගමන් මගේ මධ්‍ය ස්ථානයට ළඟාවීම එම වසරේදී සිදුවිය. එමෙන්ම දූෂණයට එරෙහි ගෝලීය පෙළගැස්ම තම උත්සාහයන්ගේ එක් ඉලක්කයක් ලෙස දරිද්‍රතාවය අවම කිරීම තව දුරටත් සපථ කරමින් 'ලීමා' ප්‍රකාශනයට[1] අස්සන් තබා වසර 10 ක් ගතවීම සනිටුහන් කළේය.

කෙසේ නමුත් එම සාර්ථකත්වයේ සත්‍ය තත්වය ඒ අපේක්ෂා කළ ප්‍රගතියට වඩා අඩු මට්ටමක පැවතිණ. ක්‍රියාත්මකභාවයේදී ආධාර ලබාදෙන්නන් සහ රාජ්‍යයන් දුප්පත් බව හා දූෂණය එකම පුරුකයන් දෙකක් ලෙස නොසළකා තවමත් එය වෙනම ඒකකයන් ලෙස සැළකීමට පුරුදුව සිටිති. දිගින් දිගටම පවත්නා ප්‍රතිපත්ති සම්පූර්ණ නොකිරීමේ අඩුව දූෂණය හා දරිද්‍රතාවයට එරෙහි සටන අවතක්සේරුවට ලක්කරන්නේය. ලෝකයේ ජනගහණයෙන් හරි අඩකටත් වැඩි සංඛ්‍යාවක් දරිද්‍රතාවයෙන් පෙළෙමින් සිටිති. බිලියන තුනකට ආසන්න ජනතාවක්[2] දිනකට ඇමරිකානු ඩොලර් 02 කට වඩා අඩු ආදායමක් ලබති. වත්මන් සංවර්ධන ප්‍රවණතාවයන් මුල් ප්‍රක්ශේපණයන් හා සමාන ඉදිරි ගමනක නොපවතින බව සහශ්‍ර සංවර්ධන ඉලක්කයන්ගේ දත්තයන් තහවුරු කරයි. ඇතැම් කලාපීය සහ තීරණාත්මක රටවල ඇතිව තිබෙන අවහිරතාවයන් 2015 ඉලක්කයන්[3] සපුරාගැනීමට එරෙහිව සැළකිය යුතු අභියෝගයක් එල්ල කිරීමට සමත්ව ඇත.

**අන්තර්ගතය**


1 සංකල්පයන් හඳුන්වාදීම

2 දූෂණය හා දරිද්‍රතාවයේ අන්තර් සබඳතාව අවබෝධ කරගැනීම

3 චක්‍රය වෙන්කිරීම

4 මීළඟ පියවර අනුගමනය කිරීම

### දූෂණය දුප්පතා පීඩාවට ලක්කරයි

දූෂණය අතිශය ප්‍රතිගාමී ලෙස දුප්පතාව පෙළන අතර එය ඒ වනවිටත් අසීරු ජීවන තත්ත්වයකට පත්ව සිටින ඔවුන් සතු සම්පත් පැහැරගැනීමකි.

මෑතකදී මෙක්සිකෝවේදී සිදු කරන ලද අධ්‍යනයකදී දුප්පත් ජනතාව විසින් උපයන ආදායමින් 25% ක් සුළු පරිමාණ දූෂණයන්ට බිලිවන බව හෙළිදරව්වී ඇත.

සෞඛ්‍ය පහසුකම් ලබාගැනීම, පාසල්වලට දරුවන් ඇතුළු කිරීම, පොලිසියේ සේවයේ ලබාගැනීමට වැනි කාරණා සඳහා අඩු ආදායම් ලබන පුද්ගලයන් අනෙකුත් ආදායම් ලාභී කණ්ඩායම්වලට වඩා නොකඩවා අල්ලස් ලබාදෙන බව වසර 2007 ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ගෝලීය දූෂණ මානයන් පිළිබඳ වාර්තාවේ සඳහන්විය.

අල්ලස් ලබාදීමට හැකියාවක් නොමැති පුද්ගලයන් තවදුරටත් කොන්වන අතර පහසුකම් ලබාගැනීම සඳහා හැකියාවක් නොමැතිවන ඔවුන් සමාජයට අමතක වූ පුරවැසියන් බවට පත්වෙති.

## 1. සංකල්පයන් හදුන්වාදීම

දුප්පත්කම පිටුදැකීම සඳහා අතීතයේදී සහ වර්තමානයේදී ගනු ලැබූ සහ ගනු ලබන උත්සාහයන් නැවත සමාලෝචනය කිරීමේදී සංවර්ධනය සඳහා තම අභිලාෂයන් ඉටුකරගැනීමට දේශපාලන, ආර්ථික සහ සාමාජීය වෙනස්කම් හදුන්වාදීමට උත්සාහ කරන රටවලට දූෂණය අඛණ්ඩවම බාධාවක් වී ඇති බව තහවුරු වේ. විවිධ රටවල සන්දර්භයන් විමර්ශනය කිරීමේදී දුප්පත්කමට මූලික හේතුව සහ ඵලවිපාකය දූෂණය බව තහවුරුවේ.

රාජ්‍යයන්, පුද්ගලික අංශය සහ මහජනතාව හරහා සිදුවන දූෂණයන් සංවර්ධන ක්‍රියාදාමයන්හි මූලික අඩිතාලමට බලපෑම් එල්ල කරනු ලබන්නේ තීරණ ගැනීම, අයවැය සැළසුම් සහ ක්‍රියාවෙහි යෙදවීමේ වැඩපිළිවෙළ විකෘති කරවමිනි. මෙම පුද්ගලයන් තමන් වෙත හිමිවන බලතල තම පුද්ගලික වාසිය සඳහා යොදාගැනීමේදී සංවර්ධනය සඳහා මහජනතාවගේ සහභාගීත්වයට ඇති ඉඩකඩ අහිමිවන අතරම පොදු දේපල, සම්පත්, පුද්ගලික පරිහරණයට ලක්වේ. තමන් ඉල්ලා සිටින සේවාවන් සහ රාජ්‍ය සහයෝගය නොමැතිවීමෙන් මෙම දූෂණ ක්‍රියාදාමයේ පීඩිතයන් බවට දුප්පත් ජනතාව පත්වේ. එසේම දූෂණය දරිද්‍රතාවයේ තවත් අතුරු නිෂ්පාදනයකි. දූෂණය මෙම ක්‍රියාදාමයේ අනු ලක්ෂණයක්, එසේත් නැතිනම් සංකේතයක් බවට පත්වූ රටවල ඒ වනවිටත් නොවැදගත් ලෙස සැළකෙන දුප්පත් ජනතාව තවදුරටත් නොසළකා හැරීමකට ඉඩකඩ ඇත. දූෂිත පරිසරයක, විශේෂයෙන් දුප්පත් ජනතාවගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් ක්‍රියාත්මක විය යුතු අවස්ථාව වනවිට ආදායම් අසමානතා ඉහළ ගොස් ධනය පැහැරගැනීමකට ලක්ව සහ රජයේ පරිපාලනය පිරිහීමට ලක්ව තිබෙන්නට පුළුවන. මෙම ප්‍රතිඵලයන් හරහා දුප්පතුන් උගුලකට හසුවුණු හා සංවර්ධනය අහිමි වූ ජනතාවක් බවට පත්විය හැක.එහිදී තම මූලික සේවාවන් ලබාගැනීම සඳහා අල්ලස් හෝ නීති විරෝධී ගෙවීම් සිදුකිරීමට බොහෝ අවස්ථාවන්වලදී දුප්පතුන්ට සිදුවනු ඇත. එහි ප්‍රතිඵලය ලෙස බහුවිධ හා විනාශකාරී බලවේගයන් බිහිවීම, දූෂණය ඉහළයාම, වර්ධන ධාරිතාව ක්ෂයවීම සහ දුප්පත්කම අවම වීමේ දර්ශකයන් මන්දගාමීවීම[4] රටකට සිදුවිය හැක. ලෝක බැංකුව උචිතවම අවවාද කර ඇති පරිදි දරිද්‍රතාවය අවම කරලීම සඳහා ඇති ප්‍රධානතම බාධකය දූෂණයයි[5].

දරිද්‍රතාවයේ සහ දූෂණයේ ඇති සම්බන්ධතාවයේ පසුබිම හා බලපෑම පිළිබඳ අබෝධය වැඩිකරලීම පදනම් කරගනිමින් මෙම පත්‍රිකාවේ ඊළඟ කොටස් පෙළගස්වා ඇති අතර ඊට එරෙහි ක්‍රියාදාමයන් ප්‍රතිසංවිධානය කිරීම දූෂණය හා දරිද්‍රතාවයේ සබඳතාවය අවම කිරීමට අවශ්‍ය පියවර පෙන්වා දී තිබේ.

## 2. දරිද්‍රතාවය සහ දූෂණයේ අන්තර් සබඳතාවය අවබෝධකරගැනීම.

දුප්පතෙකුවීම යනු යම් ආදායම් නිර්ණායකයකින් පහළට වැටීම පමණක් නොවේ. දුප්පත්කම යනු බහුවිධ මානයන්ගෙන් සැදුම්ලත් සංසිද්ධියක් වන අතර විවිධාකාර සාධකයන් ගණනාවක් එමඟින් නිරූපනය වේ. අත්‍යාවශ්‍ය ප්‍රවේශයන්, මූලික සිවිල් අයිතීන් බලාත්මකභාවය හා මානව සංවර්ධනය[6] එම සාධකයන්ට අයත්ය.

දරිද්‍රතාව සහ යථාර්ථය පිළිබඳ සංකල්පයන් ආදායම් මැනබැලීමට වඩා ඔබ්බට යා යුතු බව සහශ්‍රක සංවර්ධන ඉලක්කයන් හදුනාගෙන ඇත. එහි මධ්‍ය වාර්තාව ලෙස හැදින්වෙන වසර 2000 දී අස්සන් තැබූ සහශ්‍රක ප්‍රකාශනය දරිද්‍රතාවය අවම කරළීමේ ප්‍රධාන වර්ධනාත්මක අභියෝගයන්ට මුහුණදීම සඳහා නිදහස, සමානතාව, සහයෝගීතාවය සහ ඉවසීම යන වටිනාකම් ප්‍රවර්ධනය විය යුතු බව හදුනාගෙන ඇත.

සංවර්ධන ස්ථම්භයන් මෙන්ම පුද්ගලයෙකුගේ මානව අයිතීන් සහ එම පුද්ගලයන් ආරක්ෂා කරළීම සඳහා වන නීති පද්ධතීන් දූෂණය විසින් පිරිහීමට ලක්කරයි. යම් රටවල රාජ්‍යයන් අනවශ්‍ය බලපෑම්, අසමාන සංවර්ධනය සහ දුගී බවේ ප්‍රතිඵල[7] පිළිබඳ උපදේශනයන් හා වගවීම නොමැතිව ප්‍රතිපත්ති සහ අයවැය සම්මත කිරීමට පුළුවන. එමඟින් ජනතාව දේශපාලන, ආර්ථිකමය සහ සමාජීය වශයෙන් බලාත්මක බවින් පිරිහෙන අතරම ඒ හරහා ඔවුන් තවදුරටත් දුගී බවට පත්වේ.

දුප්පත්කම අඩුකරලීම සඳහා යෙදවීමට අපේක්ෂා කරගත් මුදල් සහ සම්පත් දූෂණය විසින් දිය කර හරින්නේය. මෙවන් ක්ෂයවීම් රටක ආර්ථික වර්ධනය, ආයෝජන මට්ටම්, දුප්පත්කම අඩුකරලීමේ උත්සාහයන් සහ අපේක්ෂිත සංවර්ධන ක්‍රියාකාරකම් අවදානමට පත්කරනු ලබයි.

ඒ අතරම සෞඛ්‍ය අධ්‍යාපන වැනි (කරුණාකර 02 වන පිටුවේ වෙන් කරන ලද කොටස බලන්න) බොහෝවිට නොමිලයේ සැපයිය යුතු බවට නීති මගින් උපදෙස් දී ඇති අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවාවන් ලබාගැනීම සඳහා අල්ලස් ලබාදීමට සිදුවීමෙන් දුගී ජනතාව සතු අවම සම්පත් පවා සුළු දූෂණයන් හරහා හීනවී යන්නේය.

තෝරාගැනීමට ඇති සීමිත අවස්ථාවන් හමුවේ අඩු ආදායම්ලාභී පුද්ගලයන් පාසලකට ඇතුලත්වීමේදී, රැකියාවක් ලබාගැනීමේදී, නිවසක් මිළදී ගැනීමේදී, ඡන්දය දීමේදී මෙන්ම සමාජයේ යම් අවශ්‍යතාවයන් නියෝජනය කිරීමේදී එම අවස්ථාව අහිමිකර නොගැනීමට සහ තම පැවැත්ම ආරක්ෂාකර ගැනීමට සැළසුමක් ලෙස අල්ලස සහ දූෂණය තෝරාගත හැක.

## මානව සංවර්ධනය සහ දූෂණය සහ සම්බන්ධ කිරීම

දූෂණය ක්‍රියාත්මකව පවත්නාවිට දුප්පත්කමට එරෙහි සටනේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන දේශපාලන වගවීම සුපිළිපන්බව සහ අන්තර්ගතය පැහැදිලිවම පිරිහී යන අතර ඇතැම්විට එම ක්‍රියාකාරකම් දක්නට හෝ නොලැබෙනු ඇත.

ට්‍රාන්ස්පේරන්සි ජාත්‍යන්තර සංවිධානය විසින් නිකුත් කරන දූෂණ සංජානන දර්ශකය අනුව එහි දූෂණය අවම රටවල් (ඩෙන්මාර්කය, පින්ලන්තය, නවසීලන්තය සහ සිංගප්පූරුව) සහ පහළම සිටින රටවල් (සෝමාලියාව, මියන්මාරය, ඉරාකය සහ හයිටි) දෙස අවධානය යොමුකිරීමේදී දුප්පත්කම, අසමානතාවය සහ දූෂණය අතර ඇති අන්තර් සබඳතාවයන් මූලිකවම හඳුනාගත හැක.

මානව සංවර්ධන දර්ශකයේ මිනුම් දණ්ඩයන්ට අනුව දූෂණ සංජානන දර්ශකයේ සඳහන් රටවල් මානව සංවර්ධන ශ්‍රේණිගතකිරීම් සසඳා බැලීමේදී දූෂණය හා මානව සංවර්ධනය අතර පවතින ශක්තිමත් බැඳීම නිරූපනය වේ. අවම දූෂණයක් පවතින රටවල මානව සංවර්ධන දර්ශකයන් ඉහළ මට්ටමක පවතී.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් නිකුත් කරන මානව සංවර්ධන දර්ශකය ලෝකයේ රටවල් 177 කට සංවර්ධන ශ්‍රේණිගත කිරීම් හිමිවන ස්ථානයන් නිර්ණය කිරීමට අදාල ලකුණු සංඛ්‍යාව හඳුනාගැනීම සහා අධ්‍යාපනය හා වැඩිහිටි සාක්ෂරතාවය, ජීවත්වීමේ කාලසීමාව සහ එක් පවුලක ආදායම දර්ශකයන් ලෙස යොදාගනිති. (ඉහළම, මධ්‍යම සහ පහළම)[9]

## මහජන වගවීමේ උපාංග

තම දේශපාලන නියෝජිතයන් ගනු ලබන තීරණ සම්බන්ධයෙන් එම දේශපාලකයන් වගවිය යුතු බවට පවතින අවශ්‍යතාවය සාක්ෂාත් කර ගැනීමට සඳහා ට්‍රාන්ස්පේරන්සි ජාත්‍යන්තර සංවිධානය ලෝක ජනතාවගෙන් මිලියන ගණනකට විශේෂයෙන් දුප්පත් ජනතාවට පහසුකම් සපයයි.

බංගලිදේශ ට්‍රාන්ස්පේරන්සි ජාත්‍යන්තර සංවිධානය ආරම්භකර ඇති ජනතාවට මුහුණදීම සඳහා වන ප්‍රජා කමිටු වැඩසටහන හරහා සංවර්ධනයට ලබාදුන් පොරොන්දු ක්‍රියාත්මක කිරීමට වගවීම සඳහා රාජ්‍යන්ට බල කෙරේ.

අනෙකුත් ට්‍රාන්ස්පේරන්සි ජාත්‍යන්තර අනුබද්ධිත ජාතික සංවිධාන ආධාරක වැඩසටහන් උපදේශන සහ නීති මධ්‍යස්ථාන මහජනතාවට ඍජුවම දූෂණයට සම්බන්ධ ක්‍රියාකාරක්ම්වලට එරෙහිව ක්‍රියාත්මකවීමට සහාය වේ. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ජෝර්ජියා සංවිධානය මෙම පහසුකම් යොදාගනිමින් බලයට පත්වන නිලධාරීන් සකස් කරනු ලබන ප්‍රතිපත්ති[10] සම්බන්ධව ඔවුන්ගේ වගකිම සහතික කිරීම සඳහා මහජනතාව සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර සන්නිවේදන ජාලයක් ආරම්භ කර ඇත.

මෙම බාධාවන් අවම කරළීම සඳහා රාජ්‍යයන් සහ ආධාර ලබාදෙන කණ්ඩායම් වල සහයෝගය ඇතිව ප්‍රතිපත්ති සහ මැදිහත්වීම් සකස් කිරීමේදී දුප්පත්කම, විෂමතාවයන් සහ දූෂණයන්හි පවතින අන්තර් සම්බන්ධතාවයන් හඳුනාගත හැකි ඒකාබද්ධ පියවරක් ඇරඹිය යුතුය. (පිටුවේ වෙන්කර ඇති කොටස බලන්න)

විශේෂයෙන් දුප්පත් රටවල දූෂණය සහ දරිද්‍රතාවයට එරෙහි සටන ආරක්ෂිත හා වඩාත් සාර්ථක කරගත හැක්කේ ඉහත සංසිද්ධීන් ඒකාබද්ධව ආමන්ත්‍රණය කළහොත් පමණි. දේශපාලන ආර්ථික හා සමාජීය අසමානතාව මගින් දූෂණය හා දරිද්‍රතාවය ඇතිකරළීම සහ එය ඉහළ දැමීම සිදුවේ.

දුගී ජනතාව වෙනුවෙන් ඔවුන්ට ලැබෙන ප්‍රතිලාභ හා අනතුරු තක්සේරු කිරීමට ගනු ලබන පියවර සහ දූෂණ විරෝධී සැළසුම් වඩාත් ප්‍රතිලාභදායක වන්නේ එමගින් ජනතාවගේ මූලික අයිතීන් ප්‍රවර්ධනය කළ විටය. මෙයට අමතරව මැතිවරණයකට පෙරාතුව රාජ්‍ය නිලධාරීන් තම රාජකාරී ආරම්භ කළ විගස සහ ප්‍රතිපත්ති පිළිබඳ සිතන්නට සහ සැළසුම් කරන්නට පටන්ගත් විට දූෂණය ඇරඹුන ස්ථානයේ සිට එයට එරෙහිව කටයුතු කිරීමට පියවර සැළසුම් කළහොත් එම මැදිහත්වීම් වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

## 3. ක්‍රියාදාමය බිඳහෙළීම

දූෂණයට සහ දරිද්‍රතාවයට එරෙහිව සටන් කිරීම යනු ජන සහභගීත්වයේ වැඩිවීමට සහ රජයේ වගවීමට එරෙහිව පැන නැගී තිබෙන බාධකයන් ආමන්ත්‍රණය කිරීමත් ඒවා ජය ගැනීමත්ය. සංවර්ධනය වෙමින් පවත්නා රටවල් බොහෝමයක් සමානාත්මතාවය හා ජනතාවගේ මූලික අයිතීන් ආරක්ෂා වී ඇතැයි පැවසුවද ඒවා ක්‍රියාවට නැංවීමේදී දුප්පතුන් වෙනුවෙන් ක්‍රියාත්මක වන්නේ කලාතුරකිනි. දුප්පත් ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් දරද්‍රතාවය වැඩි කරමින් සමාජ තත්වයන් ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාම සඳහා රටක දේශපාලන ආයතන පක්ෂ සහ ක්‍රියාපද්ධතීන් තම වාසියට හසුරුවාගැනීමට දූෂණය යොදාගත හැකි බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ජාත්‍යන්තර ආයතනයේ වසර 2004 ගෝලීය දූෂණ වාර්තාව පෙන්වා දී ඇත. දේශපාලන ආර්ථික සහ සාමාජීය වශයෙන් බැහැර කිරීම හා නොවැදගත් ලෙස සැළකීම හේතුවෙන් ඉහළම මට්ටමක පවතින සමාජයන්හි පවා දුප්පතුන්ට බොහෝ අවස්ථාවන්හිදී දූෂිත ක්‍රියාවන් අනුගමනය කිරීමට සිදුවන බව සඳහන්ව ඇත. මෙය ප්‍රජා සංවර්ධනයට අතිමහත් අභියෝගයක් එල්ල කරනු ලබයි. දූෂණ විරෝධී වැඩසටහන් දුප්පත් ජනතාවට තම මූලික සේවාවන්ට නීතිමය වශයෙන් ප්‍රවේශවීමට අවශ්‍ය විකල්ප ක්‍රියාමාර්ග සමඟ සම්බන්ධතාවයක් නොමැතිවුවහොත් එමඟින් සහායවීමට බලාපොරොත්තුවන ජනතාවට හිමිවන්නේ ඍණාත්මක බලපෑමකි.

දුප්පත් ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක දූෂණ විරෝධී වැඩසටහන් සාර්ථක කර ගැනීමට නම් දුප්පත් ජනතාවට දේශපාලන ආර්ථික හා සාමාජීය ක්‍රියා පද්ධතින්ට සහභාගීවීමට ඇති අවස්ථාවන් අහිමිකරන සන්දර්භයන් දෙස වැඩි අවධානයක් යොමුකළ යුතුය. දේශපාලන සහභාගීත්වය සහ වගවීම නොමැති වූ සහ නොවැදගත් සේ සැළකීමට ලක්වූ ප්‍රජාවන්ගේ හා පුද්ගලයන්ගේ අයිතින් වඩාත් වගවීම් සහිත රාජ්‍යන්ට සහ සම්බන්ධ කිරීම දුප්පතුන් වෙනුවෙන් දූෂණ විරෝධී සැළසුමක් සංවර්ධනය කිරීමේ මූලික පියවරයි.

රටක ප්‍රතිපත්ති ජනතාව විසින් නිර්මාණය කරනු ලබන්නේ තමන් වෙනුවෙන් පෙනී සිටීමට අදාල රජයන්ට බලය ලබාදීම හරහාය. (උදාහරණ වගවීම පිළිබඳ චක්‍රය) නමුත් රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ක්‍රියාකාරීන් මෙම ක්‍රියාදාමයන් කෙළෙසීමට ලක්කරන අතර ව්‍යවස්ථාවන් සහ ආයතන විකෘති කරති. එහි ප්‍රතිඵලයක් ලෙස සිදුවන්නේ දුප්පත්කම වැඩිවීම හා සමාන සංවර්ධනය අවම වීමය. දේශපාලන වගවීම සහ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම තුළින් දුප්පත් ජනතාව දූෂණය පිටුදැකීමේ ක්‍රියාදාමයේ අසාදාරණයට පත්වන්නන් ලෙස නොව එම ක්‍රියාදාමයේ කොටස්කරුවන් බවට පත්වනු දක්නට හැකිවනු ඇත. (වෙන්කළ කොටස බලන්න) එම ප්‍රස්තුතයන් පිළිබඳ එලෙස යළි අවධානය යොමුකිරීම ප්‍රධාන සංවර්ධන ව්‍යුහයන් කුමන ආකාරයෙන් ආමන්ත්‍රණය කළ යුතුදැයි ප්‍රශ්න මතුකරනු ඇත. වගවීම පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි හා ජනතා සහභාගීත්වය පිළිබඳ විවේචනයට ලක්වූ දුප්පත්කම පිටුදැකීම සඳහා වන උපක්‍රම වාර්තාද[11] ඊට ඇතුළත්ය. මේ වනතෙක්ම ක්‍රියාත්මකභාවයේදී එම මූලධර්මයන් ශක්තිමත් කිරීම සඳහා සම්මුතියකට එළැඹීමට සංවර්ධන සහයෝගීතා කවයන්[12] අපොහොසත්වී ඇත.

**ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ කිසිදු හෝ සාමාජික රටක් ආධාර ලබාදීමේදි ආධාර ලබාගන්නා රාජ්‍යයන් වඩාත් සමාජ වගවීම සහිත දේශපාලන ක්‍රියාදාමයන් ඇති කර තිබෙනවාද එමෙන්ම දූෂණය සඳහා වන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය අනුව කටයුතු කරනවාද යන්න පදනම් කර ගැනීමට ක්‍රියා කර නැත.**

**බොහෝ සංවර්ධනය වන රටවල පවතින පැල්පත් (මුඩුක්කු නිවාස) ආශ්‍රිතව රජයේ මැදිහත්මක් නොපවතින බව තහවුරු කරයි.රජයේ මැදිහත්මක් නොමැති මෙම ප්‍රජාවන්ගේ පරිසරයක් තුළ අපරාධයන්ට සම්බන්ධ කණ්ඩායම් බලපැවැත්වෙයි. පාතාලයන් ක්‍රියාත්මක වන විට බිය, බලහත්කාරකම සහ අනිසි බලපෑම් ඉහළ නැංවේ.**

ආර්ථික අසමානතාවය සහ වෙළෙඳපොළ බිඳවැටීම දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාව වෙනුවෙන් වඩාත් අරමුණු කරගත් දූෂණ විරෝධී උපාය මාර්ගයන් සැළසුම් කිරීමේදී ධනවත් බව හා දුප්පත් බව නිර්මාණ්‍ය වන ආකාරය සහ බලය අනිසි ලෙස යොදාගැනීම හරහා එම තත්ත්වයන්. ප්‍රත්‍යාවරෝහණයවීම හදුනාගත යුතුය. රාජ්‍ය සහ පුද්ගලික අංශ ක්‍රියාකාරීන්ගේ දූෂණ ක්‍රියාවන් වෙළඳපොළ බිඳවැටීම සඳහා පහසුකම් සළසන අතර එමඟින් ඉපයීම් අවශ්‍යතාවයන් පැන නැගීම සහ ඒවා චිරස්ථායී ලෙස පැවතීම සිදුවේ. ලතින් ඇමෙරිකාව දකුණු හා නැගෙනහිර ආසියානු සහ අප්‍රිකානු රටවල් බොහොමයක් දූෂණයන්ගේ ඉහළම මට්ටමක් සහ ඉහළම අසමාන ඉපැයීම් බෙදීයාමක් පෙන්නුම් කරයි. ලෝකයේ අසමානතාව ඉහළින්ම පවතින රටවල් 10 ක දූෂණ සංජානන දර්ශකය සසඳා බැලීමේදී එම රටවලින් හරි අඩක්ම එම දර්ශකයේ පහළම 40%ක ප්‍රතිශතයක් නියෝජනය[13] කරනු ලබන බව දැකගත හැක. ආර්ථිකය තුළ දූෂණය ඇතිවන කල්හි රජයයන් සහ පුද්ගලික ආයතන ක්‍රියාත්මක කරනු ලබන දූෂණ විරෝධී නීති හා ක්‍රියාපද්ධතීන් බිඳවැටීම් හා අයථා පරිහරණයන්ගෙන් නිරන්තර බලපෑම් ඇතිවේ. එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි සම්මුතිය හා අනෙකුත් ගොලීය මාර්ගෝපදේශයන් සහ මූල්‍යමය ක්ෂේත්‍රයේ වඩාත් දැඩි රෙගුලාසියන් පැනවීම සඳහා වන බලකිරීමේ අරමුණ දූෂණ සමීකරණයේ එම පාර්ශවය දෙස වැඩි අවධානයක් යොමුකිරීමය.

සමාජමය පළුදුවීම් සහ දුරස්ථ බව මහජනතාවට දේශපාලන හා ආර්ථික තීරණ ගැනීමේ

ක්‍රියාවලියන්ට සමබන්ධවීමට ඇති ඉඩකඩ සීමා කරයි. සමාජමය දුරස්ථ බව දුප්පතුන්ගේ සුභසාධනය සඳහා වූ දූෂණ විරෝධී උත්සාහයන්ට ප්‍රතිවිරුද්ධය. සමාජයෙන් ජන කොටස් බැහැර කිරීම යහපාලනය සඳහා වන සංකල්පයන්ට ප්‍රතිවිරුද්ධ සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයන්හි මතවාදීව ස්ථානයක් නොමැති ක්‍රියාවකි. සමාජ සමානාත්මතාව ප්‍රජාතාන්ත්‍රිකව වැළඳගත් බවට ප්‍රකාශයක් සිදුකරන රටවල පවා පහළ මට්ටමේ නීතිය ක්‍රියාත්මක කිරීමක් මෙමඟින් සිදුවිය හැක. මේ හරහා ධනවත් රටවලට එක් වැඩපිළිවෙළක් හා දුගී බවින් බිදී ගිය ජන කොටස් වාසය[14] කරන රටවල තවත් වැඩපිළිවෙළකුත් ක්‍රියාත්මක විය හැකි බවට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය අනතුරු අඟවා තිබුණි. මෙවන් දූෂණ ක්‍රියාවන් පවත්නාවිට ඇතිවන බෙදීම් හරහා රාජ්‍යයක විශ්වසනීයත්වය නීත්‍යානුකූලභාවය හා කාර්යක්ෂමතාව පළුදු වී යා හැකි අර්බුදයන්හි මුල් නිධානයන් පැන නැගීමේ ඉඩකඩ පවතී. එමගින් දුප්පත් ජනතාවට අසමානතාවයෙන් හා දූෂණයෙන් පිරුණු හා දුර්වල පරිපාලනයකින් යුක්ත වූ චක්‍රයක සිරවීමට සිදුවේ. (පැති කොටස බලන්න)..

## 4.මීලඟ පියවර අනුගමනය කිරීම

දූෂණය සහ දුප්පත්කම පාලනය කිරීම සඳහා ඉතා විධිමත් අඛණ්ඩ ප්‍රවේශ මාර්ගයක් සකස් කිරීම යනු දුප්පත් ජනතාවටද දූෂණයට එරෙහිව සටනට එක්වීම සඳහා අයිතීන් ලබාදෙන ප්‍රතිපත්ති සැකසීමය.මෙමඟින් දුප්පත් ජනතාව දූෂණ විරෝධී උපක්‍රමික වැඩසටහන්වලදී අනතුරට ලක්වන පුද්ගලයන් බවට නොව එහි ප්‍රධාන කොටස්කරුවන් හා ප්‍රතිලාභීන් බවට පත්වේ.දූෂණයට එරෙහිව සටන් කිරීමට දුප්පතුන් බලාත්මක කිරීම හරහා එම ක්‍රියාදාමයන් වඩාත් කාර්යක්ෂම කළ හැක.එමෙන්ම එම ජනතාවට සමාජයෙන් කොන් කරදැමීමෙන් හා දිළිඳු බවට පත්වීමෙන් අත්විඳිය හැක.

දුප්පත් ජනතාවට වාසිදායක අවධානයක් හිමිවන ක්‍රියාකාරකම් සඳහා රටක ප්‍රතිපත්තිමය රාමුව සහ සංවර්ධන ක්‍රියාදාමය ඉලක්ක කර ගැනීම වඩාත් ප්‍රතිඵලදායකය .උදාහරණයක් ලෙස ප්‍රතිපත්තිමය රාමුව තුළ ජනතාව සඳහා වන රජයක දේශපාලන කැපවීම බද්ධ වී තිබෙන්නට පුළුවන.ප්‍රතිපත්ති සැළසුම් කරන අවස්ථාවන්හීදී දුප්පත් ජනතාවද ප්‍රධාන පාර්ශවකරුවන් ලෙස ඊට එක් කර ගත යුතුය.එම සම්බන්ධතාවය ප්‍රතිපත්ති සහ අයවැය අනුමත කරන අවස්ථාවන්වලදී සහ රජයයන්ගේ සමාජ වගවීමේ සැමවිට පවත්නා දුර්වලතා අවම කිරීමට පරිපාලකයින් ක්‍රියාත්මක වන අවස්ථාවලදි ඔවුන්ගේ භූමිකාවට හිතකර ලෙස පෙළගැස්වීමක් හා සහාය දැක්වීමක් විය යුතුය.

නිශ්චිත ක්‍රියාකාරකම් ප්‍රතිපත්තිමය රාමුවේ සෑම පියවරක් පිළිබඳවම අවධානය යොමු කළ යුතුය.

**වසර 2015 වන විට සහශ්‍රක සංවර්ධන ඉලක්කයන් සපුරාගැනීම සඳහා ඉදිරි වසර කිහිපය තුළදී ජාත්‍යන්තර ප්‍රජාවට, රජයයන්ට සහ මහජනතාවට ඉතා දැඩි අභියෝගයන්ට මුහුණදීමට සිදුවනු ඇත.දුප්පත්කම සහ දූෂණය හරහා එල්ලවිය හැකි බාධාවන් නිසියාකාරව හඳුනාගැනීමට ඇති අවස්ථාවන් ඔවුන් විසින් ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම ඒවාට මුහුණදීමට හා මඟහැරවීමට නැවත සමාලෝචනය කළ යුතු ක්‍රියාමාර්ගද පෙන්වාදිය යුතුය.**

**අභිප්‍රායන් සැළසුම් කිරීම:** දුප්පත් ජනතාවට  සංවර්ධනය සඳහා තමන්ගේ පවත්නා ප්‍රමුඛතාවයන් පිළිබඳව අදහස් පළකිරීමට හැකිවන පිරිදි ජනතාව සමඟ එක්ව ක්‍රියාකරමින් සහ ඒවා මැතිවරණ සම්මුතීන්වලට සම්බන්ධ කිරීමෙන් මැතිවරණයන්ට පෙරාතුව හා සැළසුම් සකස් කිරීමට පෙරාතුව සංවර්ධනය හා වගවීම පිළිබඳ පොරොන්දු අනාවරණය කර ගත යුතුවේ.

**ප්‍රතිපත්ති සහ සැළසුම් කිරීම:** මෙම පියවර සඳහා දුප්පත්කම සහ සමාජ බලපෑම තක්සේරු කිරීම සඳහා ජන සහභාගීත්වය ඉතා ප්‍රයෝජනවත් උපාංගයකි.සුපිළිපන්භවේ ප්‍රධාන ඉරිතැලීම් අවබෝධ කරගැනීමට දුප්පතුන්ගේ යථාරූපී බව එක්කිරීම සඳහා  පිටුවහලක් වනු ඇත.එමෙන්ම ජාතික සංවර්ධන උපායමාර්ගයන්ට එකාබද්ධ කළ හැකි දූෂණ විරෝධී විධිවිධානයන් සකස්කිරීමටද එය උපකාරි වේ. සහභාගීත්වය ඇති ප්‍රතිපත්ති සහ අයවැය සකස් කිරීමේ අභ්‍යාසයක් යනු පොරොන්දු ඉටුකරලීම සඳහා අරමුදල් ලබාදීම සහතික කිරීමේ එක් විකල්පයක් මෙන්ම සැලසුම් සිදුකෙරෙන ස්ථානයන්හි එක් අසුනක් දුප්පත් ජනතාවට හිමිවීමත්ය.

**ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම:** තම ජීවිතයන්ට බලපෑමක් සිදුවන තීරණ ගැනීමේ ක්‍රියාදාමයන්හි ප්‍රබල භූමිකාවක් ඉටුකරලීමට දුප්පත් ජනතාවට හැකිවන පරිදි විශේෂයෙන් පළාත් පාලන මට්ටමින් ආයතනික ව්‍යුහයන් සකස් කළ යුතුය.මහජනතාවට වඩාත් වගවිය හැකි වන පරිදි ආයතනික ව්‍යුහයන් සකස් කිරීම සඳහා ප්‍රජා මණ්ඩල වැනි උදාහරණ රාශියක් පවති.

**නිරීක්ෂණය:**  ඇගයීම් කාඩ්පත් සහ ජාතික හා පළාත් මට්ටමින් ඔම්බුඩ්ස්මන්වරුන් පත් කිරීම වැනි ඉතා අඩු වියදම් ශිල්පීය ක්‍රමයන් ජන සහභාගිත්වය සඳහා යොදා ගත හැක.දූෂණය හඳුනාගැනීමට මෙන්ම මැතිවරණ නිරීක්ෂණය සඳහා ප්‍රජාවගේ සහභාගීත්වයන්ද අනෙකුත් ඉතා ප්‍රයෝජනවත් ක්‍රියාකාරකම්ය.

ඒ අතරතුරේදීම රටක සංවර්ධන ක්‍රියාවලියට දූෂණය එරෙහි දේශපාලනය හා සංවර්ධනය සඳහා වන පැහැදිලි ජාතික න්‍යාය පත්‍රයන් ඒකාබද්ධ කිරීමටද සහාය විය හැක.ඉහතින් දැක්වූ පරිදි මෙමඟින් සිදුවන්නේ ප්‍රතිපත්තීමය රාමුවක් ඉදිරියට ගෙන යාමේ සාමාන්‍ය පිළිවෙත්, ආකාල්පයන් සහ සංවේදී තත්ත්වයන් පරිවර්තනයකට භාජනය වීමය.මේ සඳහා සහයෝගය දැක්විය හැකි මාර්ගෝපදේශ මූලධර්මයන් දෙකක් වනුයේ.....

**සම්බන්ධතාවය:** ක්‍රියාකාරකම් සිදුකළ යුත්තේ දුප්පතුන් විසින් හා දුප්පතුන් සමඟය. ක්‍රියාදාමයේ සෑම පියවරකදීම ඔවුන්ගේ ක්‍රියාකාරී සම්බන්ධතාවය සහ ප්‍රජාවගේ සහයෝගීත්වය ඉහළ නැංවිය යුතුය.පළාත් පාලන මට්ටමෙන් ප්‍රජාවගේ ක්‍රියාකොරකම් ඒකාබද්ධ උත්සහයක සහ ප්‍රජාවගේ බලය ප්‍රදර්ශනය කිරීමක් ලෙස යොදාගත යුතුය.

**අයිතීන් පදනම් කර ගැනීම:** ආදායම් තත්ත්වය , කුලය, ලිංග භේදය, ආගම, අධ්‍යාපනය,ජාතිය, පිළිබඳ බාධාවකින් තොරව ජනතාවට සම්බන්ධවීමට ඉඩකඩ තිබෙන බව සංවර්ධන රාමුවන්ගෙන් ප්‍රදර්ශනය විය යුතුය.දේශපාලන කටයුතුවලට හා රටක සංවර්ධන ප්‍රතිපත්ති සකස්කිරීමේ කටයුතුවලට දුප්පත් ජනතාවටද සහභාගිවීමට ඇති හැකියාව සහතික  කිරීම මගින් ඔවුන්ගේ මානව ගෞරවය ඉහළ නැංවේ.එක්සත් ජාතීන්ගේ ප්‍රඟප්තීන්ට අනුව ජනතාවගේ මානව හිමිකම් වලට ගරු කිරීම එමඟින් ප්‍රතිරූපණය වේ.

සම්බන්ධතාවයන්ට ඉඩකඩ සැලසීම  හා අයිතීන් සුරක්ෂිත වන ප්‍රවේශයක් මඟින් ඒක පුද්ගල ක්‍රියාකාරකම් හා පද්ධතියේ කොටස් වල උත්සහායක් ලෙස දූෂණය මැඩලීමට පියවර ගැනීම වෙනුවට ඒකාබද්ධ අර්බුදයක් සඳහා ඒකාබද්ධ විසඳුමක් වඩාත් කාර්යක්ෂමව නිපදවාගැනීමට හැකිවේ.සංවර්ධන ක්‍රියාදාමයන් ක්‍රියාත්මක විය යුතු අකාරය හා ඒවායේ ප්‍රතිඵල නිරීක්ෂණය කිරීම පිළිබඳව ජාතිකමය වශයෙන් රජයේ විවිධ ක්ෂෙත්‍රයන් ,පුද්ගලික අංශය සහ  සිවිල් සමාජය තම දායකත්වය ලබාදීමේ  අවස්ථාවන් විවිධාකාරයෙන් නිර්මාණය කර ගත යුතුය. ගෝලීය වශයෙන් ජාත්‍යන්තර ආධාර දෙන කණ්ඩායමේ, බහුවිධ ආයතන සහ සිවිල් සමාජ සංවිධාන දූෂණ විරෝධී වේදිකාවන් තම සංවර්ධනය අභිමතාර්ථයන් පිළිබඳ පුළුල් එකඟතාවයක් ඇති කර ගැනීම සඳහා යොදාගත යුතුය.

මෙම වෙනස්කම් නොමැති වුවහොත් දුප්පත්කම සහ දූෂණයට එරෙහිව පවතින න්‍යාය පත්‍රයන් තවදුරටත් සමාන්තරව සහ ප්‍රගතියකින් තොර මාර්ගයක ගමන් කළ හැක.

References:
1 See: The Lima Declaration. International Anti-Corruption Convention, 7-11 September 1997. www.transparency.ca/Reports/Readings/SR-B16-e-limadecl.pdf.

2 See: www.worldbank.org/data/wdi.

3 For more information on the global progress of the MDGs, see: mdgs.un.org/unsd/mdg/Resources/Static/Products/Progress2007/MDG_Report_2007_ Progress_Chart_en.pdf.

4 See: Paolo Mauro, "Corruption and Growth," Quarterly Journal of Economics, 110, 681-712 (1995);Sanjeev Gupta, Hamid Davoodi and Rosa Alonso Terme, "Does Corruption Affect Income Equality andPoverty?" IMF Working Paper 98/76 (Washington, DC: IMF, 1998); Paolo Mauro, "The Effects of Corruption on Growth and Public Expenditure," Chapter 20 in Arnold J. Heidenheimer and Michael Johnston (eds.), Political Corruption: Concepts and Contexts. 3rd ed. (New Brunswick, NJ: Transaction Publishers, 2002).

5 See: www.worldbank.org/anticorruption.

6 See: Amartya Sen, Development as Freedom (Oxford, United Kingdom: Oxford University Press, 1999).

7 See: M. Moore, "Signposts to More Effective States." Paper prepared for the Seventh Annual Global Development Conference. (St. Petersburg, Russia: Jan. 19-21, 2006).

8 According to the Índice Nacional de Corrupción y Buen Gobierno (INCBG) undertaken by TI-Mexico in 2005, approximately 25% of the income in households earning one minimum wage goes to petty corruption. See: www.transparenciamexicana.org.mx/documentos/ENCBG/2005/Folleto_INCBG_2005.pdf.

9 The statistical correlation between the CPI and the HDI (2005) is 0.7156 at $p<0.01$). For 1995, the correlation was 0.7546 ($p<0.01$).

10 For more information on these projects, visit: www.ti-bangladesh.org/index.php?page_id=207 and www.transparency.ge/index.php?lang_id=ENG&sec_id=10150.

11 See: W. Eberlei, "Accountability in Poverty Reduction Strategies: The Role of Empowerment and Participation", Social Development Papers: Participation and Civic Engagement (104). (Washington, DC: The World Bank, 2007).

12 See: OECD, "Overview by the DAC Chair," In Development Co-operation Report. Vol.8(1), chapter 1 (Paris, France: OECD, 2007).

13 The comparison is based on 2007 data on Gini coefficients from the World Bank. See: World Bank, World Development Indicators (Washington, DC: World Bank, 2007). Further analysis shows,however, that it is difficult to statistically prove a correlation between corruption as measured by theCPI and the Gini coefficients reported by the World Bank.

14 See: Transparency International, Global Corruption Report. (Oxford, United Kingdom: Oxford University Press, 2007).